# ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය නියාමනය කිරීම සහ මැතිවරණ ක්‍රියාවලිය

**නව මැතිවරණ ක්‍රමයක් - ජනතාවට වගකියන මහජන නියෝජිතයෙක් :**

අද වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමානුපාතික නියෝජන ක්‍රමය කේන්ද්‍රකරගත් මැතිවරණ ක්‍රමය, කොට්ඨාශ ක්‍රමය (කේවළ) මූලික කරගත් මැතිවරණ ක්‍රමයක් ලෙසට වෙනස් කළ යුතුය යන්න මෙරටේ ජනතාව අතර මුල්බැස ගත් අදහසක් බවට පත්ව ඇත. ඊට අමතරව පසුගිය පෙබරවාරි මස 08 වැනි දින පැවති පළාත් පාලන ඡන්ද විමසීම ද පැවැත්වූයේ කොට්ඨාශ ක්‍රමය පදනම් කරගත් මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් යටතේය. එනම් මිශ්‍ර සහිත සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ය.

දැනට ක්‍රියාත්මක සමානුපාතික නියෝජන ක්‍රමයේ කවර සුවිශේෂතා පැවතිය ද කොට්ඨාශ ක්‍රමය කරා නැවත වතාවක් ගමන් කිරීමට තරම් මෙරටේ ජනතාවට බලපෑම් කරන ලද හේතු කාරණා බොහෝ පවතී. සමානුපාතික නියෝජන ක්‍රමයේ අයහපත් ලක්ෂණ විග්‍රහ කරන බොහෝ දෙනෙක් ගෙන එන එක් තර්කයක් වන්නේ දැවැන්ත මැතිවරණ ව්‍යාපාරයක් දියත් කරමින් අසීමාන්තිකව මුදල් වැය කළ හැකි අපේක්ෂකයන් හට ජයග්‍රහණය ලැබීමට එම ක්‍රමය තුළ වැඩි ඉඩක් හිමිවන බවයි. එලෙස ඉතා විශාල ලෙස මුදල් වැයකළ නොහැකි, එහෙත් අවශ්‍යයෙන්ම ජනතාව නියෝජනය කළ යුතු කාන්තා, තරුණ හා වෙනත් ක්ෂේත්‍රයන්හී යම් මෙහෙවරක් කරන ලද පිරිස් මැතිවරණයක් සඳහා තරග කරන කලෙක, ඉතා විශාල මුදල් සම්භාරයක් වැය කරන අපේක්ෂකයන් හමුවේ පසුබෑමට ලක්වීමේ යම් සම්භාවිතාවක් පවතීය යන්න බැහැර කළ නොහැකි කරුණකි.

ප්‍රජාතන්ත්‍රවාදය අභ්‍යාස කිරීමේ පිළිගත් ඍජු ක්‍රමවේදය වන්නේ ජනතා නියෝජිතයන් තෝරා ගැනීම සඳහා කලින් කලට මැතිවරණ පැවැත්වීමයි. එවැනි මැතිවරණයක් සඳහා ඉදිරිපත් වන තරගකරුවන් හෙවත් අපේක්ෂකයන් සඳහා "සම තරග බිමක්" (Level Playing Field) වෙනුවට සම අවස්ථා නොමැති තරග බිමක් නිර්මාණය වී තිබේනම්, එවැනි තත්ත්වයක් කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකිය. එවැනි අවස්ථාවක දී පුරවැසියන් ලෙසින් අප ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද? අපට සමීප වෙනත් රටවල් එවැනි තත්ත්වයන් වළක්වාගෙන ඇත්තේ කවර ආකාරයෙන් ද? මෙම පත්‍රිකාවෙන් උත්සාහ කරනුයේ මෙරටේ සුපිළිපන්න මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් තවදුරටත් සළකා බැලිය යුතු මූලික කරුණක් පිළිබඳව අවධානය යොමු කිරීමයි.

> **"හොඳ තරගකාරීත්වයක්" සහ සමාන අවස්ථා ඇති දේශපාලන පරිසරයක් යන සාධක දෙක අතර මනා සමබලතාවයක් පවත්වා ගැනීම සඳහා අදාළ මූල්‍ය නියාමන රෙගුලාසි තාත්වික හා සාධාරණ විය යුතුය. එහිදී දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් හා පුරවැසියන්ගේ සාධාරණ අවස්ථා අවධානයට ලක් කළ යුතුය. එහිදී ප්‍රචාරණ අමුද්‍රව්‍ය, ප්‍රචාරණ සේවා සහ දැන්වීම් පළකිරීම ආදිය සඳහා වන වියදම සාධාරණ අයුරින් සළකා බැලිය යුතුය".** (දකුණු ආසියාවේ දේශපාලන කටයුතු සඳහා මුල් වූ පිරිවැය නියාමන පිළිබඳ නවදිල්ලි ප්‍රකාශනය)

මැතිවරණයකින් ජය ගැනීම සඳහා දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් භාවිත කරන ක්‍රමවේද එකිනෙකට වෙනස් විය හැකිය. එකී උපක්‍රම විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය මෙන්ම තොරතුරු තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් ජනගත කිරීමට වැය කරන මුදල් ප්‍රමාණයන් ද එකිනෙකට වෙනස් ය. ලොව විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ මෙහෙයුම සිදුකරන්නේ ඉන්දියාවයි. එරටේ අවසන් වරට එනම් වසර 2014 දී පැවති මහා මැතිවරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන් පොදුවේ මැතිවරණ ප්‍රචාරණය සඳහා වැය කර තිබූ මුදල ඇ.ඩො. බිලියන 5 ක් විය. එය දෙවැනි වූයේ ඇමෙරිකා එක්සත් ජනපදය, ඒ හා සමාන මැතිවරණයකට වැය කරන මුදලට (ඇ.ඩො බිලියන 7 ක්) පමණි.

අප, මෙරටේ පවත්වන මැතිවරණයක් තුළදී කවර මුදල් ප්‍රමාණයක් ඒ ඒ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් වැය කර ඇත්දැයි මෙතෙක් නිශ්චිත සමීක්ෂණයක් කවරෙකු විසින් හෝ සිදුකර නැත. සමහර අපේක්ෂකයන්, මෙරටේ අවසන් වරට එනම් වසර 2015 දී පැවැත් වූ මහා මැතිවරණය සඳහා තමන් වැය කළ මුදල් ප්‍රමාණය පිළිබඳ යම් යම් ප්‍රකාශ වරින් වර කරනු ලැබීය.

ඉන් එක් එක් ජයග්‍රාහී අපේක්ෂකයෙක් දැක් වූ පරිදි ඔහුගේ මැතිවරණ ප්‍රචාරක වියදම රුපියල් ලක්ෂ 800කි. එකී මුදලේ විශාලත්වය කෙතරම් ද යත්, මෙරටේ ප්‍රාදේශීය සභා බොහෝ ප්‍රමාණයක්, තම බල ප්‍රදේශයේ ජනතාවට සේවා පහසුකම් සැපයීම සඳහා වැය කරනු ලබන වාර්ෂික වියදම රුපියල් ලක්ෂ 80 කට නොවැඩි අතර එක් අපේක්ෂකයෙක් මෙතරම් මුදල් ප්‍රමාණයක් වැය කිරීම සඳහා අවැසි මුදල් සොයාගන්නේ කෙලෙස ද යන්න පිළිබඳව දැනගැනීමට මෙරටේ ඡන්දදායකන් සතුව අයිතියක් ඇත.

*මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාර, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය*